“ඔබ ඔහු මරා නොදැමිය යුතුයි. එසේ ඔබ ඔහු මරා දැමුවේ නම්, සැබැවින්ම ඔහු, ඔබ මරා දැමීමට පෙර ඔබ සිටි තත්ත්වයේ ඔහු වන්නේය. එමෙන්ම ඔබ, ඔහු ප්රකාශ කළ වදන ඔහු ප්රකාශ කිරීමට පෙර ඔහු සිටි තත්ත්වයේ ඔබ වන්නෙහිය.” යැයි පැවසූහ

අල්-මික්දාද් ඉබ්නු අම්ර් අල්-කින්දී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා
කරන ලදී: හෙතෙම අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) "දේවත්වය ප්රතික්ෂේප කළ ප්රචණ්ඩකාරී මිනිසෙකු මා හමු වී අපි එකිනෙකා සටන් වැද මගේ අත් දෙකින් එක් අතකට ඔහු කඩුවෙන් පහර දී එය කපා වෙන් කළේය. පසුව ඔහු මගෙන් පළා ගොස් ගසකට මුවා වී පසුව 'මම අල්ලාහ්ට යටත් වෙමි' යැයි පවසයි. අල්ලාහ්ගේ දූතයාණනි! එසේ ඔහු පැවසූ පසුව ඔහුව මා මරා දැමීම ගැන ඔබේ අදහස කුමක් ද?" යැයි විමසුවේය. එවිට එතුමා “ඔබ ඔහු මරා නොදැමිය යුතුය” යැයි පැවසූහ. පසුව මම: අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! ඔහු මගේ අත් දෙකින් එකක් කපා ඇත. ඔහු එසේ එය පවසා සිටියේ කපා දැමුවායින් පසුවය? යැයි පවසා සිටියේය. එවිට අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි
වසල්ලම්): “ඔබ ඔහු මරා නොදැමිය යුතුයි. එසේ ඔබ ඔහු මරා දැමුවේ නම්, සැබැවින්ම ඔහු,
ඔබ මරා දැමීමට පෙර ඔබ සිටි තත්ත්වයේ ඔහු වන්නේය. එමෙන්ම ඔබ, ඔහු ප්රකාශ කළ වදන ඔහු ප්රකාශ කිරීමට පෙර ඔහු සිටි තත්ත්වයේ ඔබ වන්නෙහිය.” යැයි පැවසූහ.
[صحيح] [متفق عليه]

අල්-මික්දාද් ඉබ්නුල් අස්වද් (රළියල්ලාහු අන්හු) තුමා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් මෙසේ විමසා සිටියේය. හෙතෙම දේවත්වය ප්රතික්ෂේප කළ ප්රචණ්ඩකාරී මිනිසෙකු යුද පිටියේ හමු වී තමන් එකිනෙකා සටන් වැද අවසානයේ දේවත්වය ප්රතික්ෂේප කළ අය තම අතකට කඩුවෙන් පහර දී එය කපා වෙන් කළේය. පසුව ඔහු පළා ගොස් ගසකට මුවා වී ආරක්ෂාව සළසා ගෙන අවසානයේ ඔහු 'ලා ඉලාහ ඉල්ලල්ලාහු (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් කිසිවකු නැත)' යැයි පවසා සිටියේය. ඔහු මගේ අත කපා දැමීමෙන් පසු මා විසින් ඔහු මරා දැමීමට මට අවසර ඇත්දැ?යි විමසා සිටියේය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ: “ඔබ ඔහු මරා නොදැමිය යුතු යැ"යි ඔහුට පවසා සිටියහ. එවිට ඔහු: "අල්ලාහ්ගේ දූතයාණනි! සැබැවින්ම ඔහු මගේ අතක් කපා දමා ඇත. එසේ තිබිය දී මා ඔහු මරා දැමීමට මට නොහැකි ද?" යැයි වමසුවේය. එවිට සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ, "ඔබ ඔහු මරා නොදමනු යැයි" පවසා "දැන් ඔහුගේ ජීවිතය නැතිකරන්නට තහනම් තත්ත්වයක ඔහු පසුවන්නේය. එහෙයින් ඔහු ඉස්ලාමයට පැමිණි පසු ඔබ ඔහුව මරා දැමුවෙහි නම්, දැන් ඔහු ඔබේ නිලයෙහි පසුවන බවත් ඔහු ඉස්ලාමයට පැමිණීමත් සමග ඔහුගේ ජීවිතයට ආරක්ෂාව ලැබුණු බවත් දැනගත යුතුය. එමෙන්ම ඔබ සිටින්නේ ඔහුගේ නිලයෙහිය. ඔබට ඔහු මරා දැමීමට අවසරය ඇත්තේ සමප්රතිචාර දැක්වීමක් වශයෙන් පමණ ය." යැයි පැවසුහ.